සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

V

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2006

පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ
සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2006 අගෝස්තු

# I පත්‍රය

**මිනිත්තු 45 යි.**

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| **එකතුව** | |

**අවසාන ලකුණ**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂක | |
| ගණිත පරීක්ෂක | |
| අධීක්ෂක | |

## විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

✳ ඔබේ විභාග අංකය මේ කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**විභාග අංකය** ........................................

✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු තුන බැගින් දී ඇත. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

✳ අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු නියමිත හිස්තැන්වල ලියන්න.

✳ කටුවැඩ සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

[ දෙවැනි පිටුව බලන්න.


**අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු තුන බැගින් දී ඇත.**
**ඒවායින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**1.** කවියෙන් විස්තර කෙරෙන පක්ෂියා තෝරන්න.

අඟර පිණිස පලතුරු කන
අහසේ වේගයෙන් සරණ
ගහ කොළපාටින් යුතුවන
කුරුල්ලෙක්ය ඒ දන මැන


(1)


(2)


(3)

**2.** කවියෙන් විස්තර කෙරෙන මල තෝරන්න.


උදයේ හිරු රැසට පිපෙන
දිනයේ දිළෙන සවස මියෙන
සුවඳ හමන සිත සනසන
මලක් වේය දන පිනවන


(1)


(2)


(3)

**3.** පහත කොටු තුළ ඇති රූප බලන්න. එක් එක් රූපය සඳහා ඉංග්‍රීසි අකුරු යොදා ඇත.




උදහරණය බලා, හොඳම සම්බන්ධතාව දැක්වෙන පරිදි රූප යුගල කොට ඇති නිවැරදි පිළිතුර තෝරන්න.

| උදහරණය A : G |
|---|

(1) B : F, C : H, D : E
(2) B : H, C : F, D : E
(3) B : H, C : E, D : F

- **පහත සඳහන් කවිය කියවා 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දැන ඉගෙන ගත්කම
තමයි කෙනකුගෙ වත්කම
ගුණ නුවණ දැක්කම
ඔබට සලකයි රටේ ඔක්කොම

**4.** කෙනකුගේ වත්කම වන්නේ කුමක් ද?
(1) ඉගෙන ගත් දෙය (2) ගුණ නුවණ (3) හොඳ ගති ගුණ

**5.** අනුන්ගෙන් සැලකිලි ලබා ගැනීමට ඇති කර ගත යුතු ගුණාංගය කුමක් ද?
(1) හොඳින් ඉගෙනීම (2) ගුණ නුවණ වැඩීම (3) සංවරව හැසිරීම

**6.** "හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ" යන්නෙහි අදහස කුමක් ද?
(1) ගසක වැඩීම පැති දෙකකින් හඳුනා ගත හැකි බව ය.
(2) කෙනකු හොඳට හැදෙනවා ද යන්න කුඩා කාලයේ දී ම දනගත හැකි බව ය.
(3) ළමයකුගේ වැඩීමට කුඩා කාලයේ දී හොඳින් උදව් කළ යුතු බව ය.

7. සුමනාත්, ලීලාත් කුඩා කල පටන් ම එකට හැදුණු වැඩුණු යෙහෙළියන් දෙදෙනෙකි. මෑතක සිට පංතියට අලුතින් පැමිණි සුසිලා සමඟ සුමනා වැඩි හිතවත්කමක් ඇති කරගෙන තිබිණි. මේ තත්ත්වය හොඳින් නිරූපණය කරන ප්‍රකාශය තෝරන්න.

(1) ඉඟුරු දී මිරිස් ගත්තා වගෙයි.

(2) වැල යන පැත්තට මැස්ස ගහන්නා වගෙයි.

(3) කලින් ආ කණට වඩා පස්සේ ආ අඟ ලොකු උනා වගෙයි.


8. ගොඩනැගිල්ලක් පහත සඳහන් පියවර තුන යටතේ ඉදිකිරීමට සැලසුම් කර තිබිණි.


| පියවර | ගතවන කාලය |
|---|---|
| 1 | අවුරුදු 2 යි. |
| 2 | පියවර 1 මෙන් දෙගුණයකි. |
| 3 | පියවර 1 මෙන් බාගයකි. |


ගොඩනැගිල්ල ඉදිකිරීම 2004 වසරේ දී ආරම්භ කළේ නම් එය නිම කළ හැකි වන්නේ කුමන වසරේ දී ද?


(1) 2010 (2) 2011 (3) 2012

9. පහත ඇති රූපය කඩදාසි තීරු දෙකක් නවා සකස් කර ඇත. ඒ සෑදීමට යොදා ගත් කඩදාසි තීරු දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.





(1) 


(2) 


(3) 

10. රූපය බලන්න. හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.




(1) 


(2) 


(3) 

11. රූපයේ දැක්වෙන හැඩය ලබා ගැනීම සඳහා හතරට නවන ලද කඩදාසි කැබැල්ලක් නිවැරදි ව කැපිය යුතු ආකාරය තෝරන්න.





(1)


(2)



(3)

12. කොටුව තුළ ඇති රූපය නිවැරදි ව පෙන්වන පිළිතුර තෝරන්න.



(1) (2) (3)

• පහත සඳහන් සටහන ඇසුරෙන් 13 හා 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




13. අඹ ගෙඩි 3 ක හා දෙඩම් ගෙඩි 5 ක මිල කීය ද?
(1) රුපියල් 44 (2) රුපියල් 58 (3) රුපියල් 66


14. අඹ ගෙඩි 1 ක හා දෙඩම් ගෙඩි 1 ක මිල කීය ද?
(1) රුපියල් 11 (2) රුපියල් 14 (3) රුපියල් 18

• සමන් පිරිමි ළමයෙකි. සමන්ගේ අක්කාට සහෝදරයෝ දෙදෙනෙක් ද සහෝදරියෝ දෙදෙනෙක් ද සිටිති.

15. සමන්ට සිටින සහෝදරයින් ගණන කීය ද?
(1) 3 යි. (2) 2 යි. (3) 1 යි.

16. සමන්ට සිටින සහෝදරියන් ගණන කීය ද?
(1) 2 යි. (2) 3 යි. (3) 4 යි.

• තොරණක තිබූ විදුලි බුබුළු ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත ආකාරයට සංකේත ඇසුරෙන් දක්වා ඇත.




17. ඒ අනුව තොරණේ වැඩියෙන් ම ඇත්තේ කුමන පාට විදුලි බුබුළු ද?
(1) නිල් පාට විදුලි බුබුළු ය. (2) රතු පාට විදුලි බුබුළු ය. (3) කොළ පාට විදුලි බුබුළු ය.

18. එක් එක් පාටින් තොරණේ ඇති විදුලි බුබුළු සංඛ්‍යා අඩු බවේ සිට වැඩි බවට පිළිවෙළින් දැක්වුවහොත් ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) නිල්, රතු, කොළ (2) කොළ, රතු, නිල් (3) කොළ, නිල්, රතු

• පහත සඳහන් ප්‍රකාශය බලන්න.

2 ✳ 3 = 3 # 3

එහි = ලකුණින් සමාන බව අදහස් කෙරේ. සම්මත ගණිත කර්ම වෙනුවට ✳ හා # භාවිත කර ඇත. ඒ අනුව

19. ✳ ලකුණ යොද ඇත්තේ කුමක් සඳහා ද?
(1) එකතු කිරීම (2) අඩු කිරීම (3) ගුණ කිරීම

20. # ලකුණ යොද ඇත්තේ කුමක් සඳහා ද?
(1) එකතු කිරීම (2) අඩු කිරීම (3) බෙදීම


[ පස්වැනි පිටුව බලන්න.

21. සමන්ට සෑම ඉරිදා සහ බදාදා දවසක ම නිවාඩු ලැබේ. ඔහුගේ බිරිඳට දවසක් හැර දවසක් නිවාඩු ලැබේ. අද ඉරිදා දවසකි. දෙදෙනාට ම නිවාඩු ලැබී ඇත.
ඒ අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලබන ඉරිදත් ඔවුන් දෙදෙනාට ම නිවාඩු ලැබෙනු ඇත.
(2) තව දින අටකින් ඔවුන් දෙදෙනාට ම නිවාඩු ලැබෙනු ඇත.
(3) ලබන බ්‍රහස්පතින්ද සමන්ගේ බිරිඳට පමණක් නිවාඩු ලැබෙනු ඇත.

22. මිනිසුන් හතරදෙනකු එකම තැනින් පටන්ගෙන ඇවිදගෙන ගිය අතර පැය හතරක දී ඔවුන් ගමන් කළ දුර කිලෝමීටර 16 ක් විය.
පැය එකක් තුළ එක් මිනිසකු ඇවිද ගිය දුර කොපමණ ද?
(1) කිලෝමීටර 1 කි. (2) කිලෝමීටර 4 කි. (3) කිලෝමීටර 5 කි.

23. මීටර 4 ක් දිග මීටර 4 ක් උස බිත්තියක ගෑමට තීන්ත ලීටර දෙකක් අවශ්‍ය වෙයි. මීටර 8 ක් දිග මීටර 1 ක් උස එවැනිම බිත්තියක ගෑමට තීන්ත ලීටර කීයක් අවශ්‍ය ද?
(1) ලීටර 1 යි. (2) ලීටර 2 යි. (3) ලීටර 4 යි.

24. කැඩපතක් තුළින් ඔරලෝසුවක් පෙනෙන ආකාරය පහත රූපයෙන් දක්වේ. එම ඔරලෝසුවේ සත්‍ය වේලාව කීය ද?



(1) 2.55
(2) 3.05
(3) 9.05

- පහත දක්වා ඇති සංවාදය කියවන්න.

දුරකථනය නාදවෙයි. ගෙහිමි කාන්තාව පිළිතුරු දෙයි.

× හලෝ ! . . . කවුද කථා කරන්නේ?
- කථා කරන්නේ අයියා . . . අපේ පුතා අද උදේ ඔහේ ආව ද?
× නැහැ . . . ආවෙ නැහැ . . . කමල් නම් කිව්වා ඊයෙ පන්සලේ දී එයාව මුණගැහුණ කියල
- නංගී . . . මේ වෙලාවෙ කමල් ගෙදර ඉන්නවද? . . .
× නැහැ . . . අද එන්න පරක්කු වෙනව කිව්ව . . . වැඩ ඇරිල එන ගමන් මහප්පා බලන්න යනව කිව්ව . . . මහප්පා මේ දවස්වල අසනීපයෙන්
- මොකද්ද අසනීපය ?
× උණ හැදිල . . . දන් පුමාතයක් විතර වෙනව . . .
- කමල් ගෙදර ආවම මට කෝල් එකක් දෙන්න කියන්න.
× හා . . . හොඳයි . . . සුබ රාත්‍රියක්

25. මේ දුරකථන සංවාදයේ දී පුද්ගලයින් කීදෙනකු ගැන සඳහන් වේ ද?
(1) හතරදෙනකු (2) පස්දෙනකු (3) හයදෙනකු

26. මේ දුරකථන සංවාදය ඇතිවන්නට ඇත්තේ දවසේ කිනම් කාලවේලාවක දී ද?
(1) උදේ 10 ට පමණ (2) දවල් 2 ට පමණ (3) සවස 7 ට පමණ

- මෙම පද්‍යය කියවන්න. ඒ ඇසුරෙන් **27** හා **28** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිප් . . . . . ✻ . . . . . . ඉගෙනුම  
ගෙන දෙයි සැමට දස් කම්  
. . . . # . . . . අලස කම්  
වඩනු ඉගෙනුම කෙරේ දැඩි පෙම

**27.** ✻ සලකුණ ඇති තැනට සුදුසු වචනය තෝරන්න.
(1) සයුර (2) සතර (3) පතර

**28.** # සලකුණ ඇති තැනට සුදුසු වචනය තෝරන්න.
(1) පෙරළා (2) දුරලා (3) නොහැරා

**29.** කැඩපතක් ඉදිරියේ සිටගත් කාන්තාවක තම රූපය දක්වමින් කරන ලද පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් විය හැකි ද?
(1) මේ කැඩපතේ දක්වෙන තැනැත්තිය මගේ මවගේ සොහොයුරියයි.
(2) මේ කැඩපතේ දක්වෙන තැනැත්තිය මගේ මවගේ සුළු මවයි.
(3) මේ කැඩපතේ දක්වෙන තැනැත්තිය මගේ මවගේ එකම දියණියයි.

**30.** කැඩපතක් ඉදිරියේ සිටගත් පුද්ගලයකු තම රූපය දක්වමින් කරන ලද පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් විය හැකි ද?
(1) මේ කැඩපතේ දක්වෙන අයගේ පියා මගේ පියා ය.
(2) මේ කැඩපතේ දක්වෙන අය මගේ සුළු පියා ය.
(3) මේ කැඩපතේ දක්වෙන අය මගේ පුතාගේ මාමා ය.

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු, දී ඇති හිස්තැනෙහි ලියන්න.

**31.**

| | | |
|---|---|---|
| වතුර | නලාව | පනාව |
| රබාන | රාත්‍රිය | වදුරා |


කොටුව තුළ ඇති වචන පහත ඇති ආකාරයට පෙළ ගස්වන ලදී. එහි රටාව තේරුම් ගෙන හිස්තැන්වලට සුදුසු වචන තිත් ඉරි මත ලියන්න.

පනාව → වතුර → රබාන → .................. → .................. → ..................

**32.** පහත ඇති ප්‍රහේලිකාවේ හරහටත් පහළටත් තේරුමක් ඇති වචන යොදා එම ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. දී ඇති උපකාරක වැකි ප්‍රයෝජනයට ගන්න.


පහළට : 1. රෙදි කැපීමට ගන්නා උපකරණයකි.
2. ඇඳට කියන තවත් නමකි.

හරහට : 1. වතුර ගෙනෙන භාජනයකි.
3. වාද්‍ය භාණ්ඩයකි.




**33.** එක හා දෙක තරාදිවල ඇති ද්‍රව්‍ය සහ ඒවායේ බරවල එකතුව නිරීක්ෂණය කරන්න. තුන්වන තරාදියේ ඇති ද්‍රව්‍යවල බර කිලෝග්‍රෑම් කීය ද?

1 තරාදිය | 2 තරාදිය | 3 තරාදිය



කිලෝග්‍රෑම් 6 | කිලෝග්‍රෑම් 8 | කිලෝග්‍රෑම් ............

**34.** පහත ඇති ද්‍රව්‍යවල මිල ගණන්වල එකතුව බලා පොතක මිල කීයදැයි සොයන්න.





පොතෙහි මිල රුපියල් ............

**35.** මෙහි වැඩි ම වාර ගණනක් සඳහන් වන ඉලක්කම කුමක් ද?

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | 8 | 5 | 3 | 8 | 2 | 6 | 5 |
| 4 | 3 | 4 | 2 | 9 | 6 | 3 | 2 |


............

**36.** මෙහි වැඩි ම වාර ගණනක් යෙදී ඇති හැඩය කුමක් ද?




............

**37.** එකම ඝනකයක විවිධ පැති මෙහි දැක්වේ.





W අකුරට විරුද්ධ පැත්තේ ඇති අකුර කුමක් ද? ............

**38.** එකම ඝනකයක විවිධ පැති මෙහි දැක්වේ.




6 ඉලක්කමට විරුද්ධ පැත්තේ ඇති ඉලක්කම කුමක් ද? ............

● පහත දැක්වෙන්නේ සරත්, විමල්, අසේල යන තිදෙනා ව්‍යායාම පිණිස ඇවිදීමට යොදගන්නා ගමන් පථ තුනකි. පුද්ගලයින් තිදෙනා යොද ගන්නා ගමන් පථවල ආරම්භය A, B, C යන අක්ෂරවලින් ද අවසානය X, Y, Z යන අක්ෂරවලින් ද දැක්වෙයි.




**39.** මේ පුද්ගලයින් තිදෙනා අතුරෙන් කවරෙක් දිග වැඩි ම ගමන් පථයේ ගමන් කරයි ද?

......................

**40.** මේ පුද්ගලයින් තිදෙනා මෙම ගමන් පථ තුනේ ගමන් කරන විට වැඩි ම වාර ගණනක් තම වම් පසට හැරෙන තැනැත්තා කවුද?

......................

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2006

# පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2006 අගෝස්තු

## II පත්‍රය

පැය 1 මිනිත්තු 15 යි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂක | |
| ගණිත පරීක්ෂක | |
| අධීක්ෂක | |

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

* ඔබේ විභාග අංකය මේ කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**විභාග අංකය** ........................................

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **48** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි **පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත ලියන්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසි දෙකක් සපයනු ලැබේ.

1. පහත දැක්වෙන කවි පෙළ කියවන්න.

සමන්පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අත්ත බලනු
කොච්චර ලස්සන ද රට

බකමූණෝ පියාඹති
අහික් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන
මා වවුලෝ කෑගසති

මගෙ පුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනිබින්දුත්
හදමු එකක් ඒ වාගේ

- (ළමා කවි කළඹ - ඇස්. මහින්ද හිමි)

කවි පෙළ ඇසුරෙන්, අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) කවියා "ලස්සන" යැයි කියන්නේ කුමකට ද? ....................................

(ii) කවි පෙළෙහි, අවදියෙන් සිටින බව සඳහන් සතකු නම් කරන්න. ....................................

(iii) මෙහි සඳහන් ප්‍රාණවාචී බහුවචන නාමපදයක් ලියන්න. ....................................

(iv) මෙහි සඳහන් අප්‍රාණවාචී බහුවචන නාමපදයක් ලියන්න. ....................................

(v) මෙහි ඇතුළත් උපමාවක් ලියන්න. ....................................

(vi) කවි පෙළෙහි දැක්වෙන විශේෂණ පදයක් තෝරා ලියන්න. ....................................

(vii) මෙහි ඇති ස්ත්‍රී ලිංග නාමපදය කුමක් ද? ....................................

(viii) මෙහි ඇති උත්තම පුරුෂ බහුවචන ක්‍රියාපදය කුමක් ද?. ....................................

(ix) "කුරුල්ලෝ නිදති" යන්න ඒකවචනයට හරවා ලියන්න. ....................................

(x) සැබවින් ම කළ නොහැකි දෙයක් කවි පන්තියෙහි සඳහන් වෙයි. ඒ කුමක් ද? ....................................

2. වචන ගළපා අර්ථවත් වැකි ගොඩනගන්න.

(i) වැව් / ජනකතා / රැස් / ආශ්‍රිත / කරයි / තරිඳු

....................................................................................................

(ii) මාරුවීමට / කහ / භාවිත / ඉර / කරමු / පාර / නිතර

....................................................................................................

....................................................................................................

3. පහත සඳහන් යෙදුම්වල අදහස ලියන්න.

(i) මීයට පිම්බා වගේ : ....................................................................

(ii) ගලේ කෙටුව අකුරක් වගේ : ....................................................................

....................................................................

4. හිස්තැනට ගැළපෙන නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන තුළින් තෝරා ලියන්න.

(i) සිසුහු දිවා ........................... සඳහා කඩල, මුං ඇට ආදිය ද ගෙන එති.
(භෝජනය, බෝජනය, භෝජණය, බෝජණය)

(ii) පසුගිය වසරේ ........................ ලංකා වටයට තේරී පත් වූ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ද මෙම උත්සවයට සහභාගි වූහ.
(සමස්ථ, සමස්ත, සමශ්ත, ශමස්ත)

(iii) නිතර ................................ පරිහරණය කිරීමෙන් දැනුම වැඩෙයි.
(පුස්තකාළය, පුස්තකාලය, පුශ්තකාලය, පුස්ථකාලය)

5. (i) හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

We buy ...................... from the Post Office.
(books, pencils, stamps, bags)

(ii) හිස්තැන්වලට සුදුසු වචන ඉංග්‍රීසියෙන් ලියන්න.




6. අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Good Morning : ..............................................................

(ii) Please come here : ..............................................................

(iii) What is this? : ..............................................................

7. පහත දක්වෙන එක් එක් දෙමළ වචනයේ අර්ථය, තිත් ඉරි මත සිංහලෙන් ලියන්න.




- **අංක 8 සිට 28 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

8. අවුරුද්දට එක්වරක් පමණක් ගෙඩි හටගන්නා පලතුරක් වන්නේ
(1) පැපොල් ය. (2) කජු ය. (3) කෙසෙල් ය. (4) පේර ය.

9. පුළගේ ආධාරයෙන් බෝවන ශාකය කුමක් ද?
(1) දෙඹ (2) ඉරිවේරිය (3) මොණරකුඩුම්බිය (4) තිප්පිලි


10. පුරුක් පණුවාගෙන් හානි සිදුවන ශාකයක් වන්නේ
(1) වම්බටු ය. (2) පතෝල ය. (3) කුරක්කන් ය. (4) ගොයම් ය.


[ හතරවැනි පිටුව බලන්න.


11. 

රූපයේ පෙන්වා ඇති ඉස්කුරුප්පු ඇණය සවිකිරීමට යොදා ගත හැකි වඩාත් ම සුදුසු ආවුදය මේවායින් කුමක් ද?


(1)



(2)


(3)



(4)

12. ඇඳ සිටින ඇඳුමකට ගිනි ඇවිළී ඇති කෙනකු බේරා ගැනීම සඳහා ඉක්මනින් කළ යුතු වඩාත් ම සුදුසු දේ කුමක් ද?
(1) සනකම රෙද්දකින් එතීම  (2) බිම පෙරළීමට සැලැස්වීම
(3) ඇඳුමෙහි පිලිස්සෙන කොටස් ඉරා දැමීම  (4) වෛද්‍යවරයකු වෙත ගෙන යාම


13. වතුර වීදුරුවකට පොල්තෙල් ස්වල්පයක් දමා ටික වේලාවකට පසුව දැකිය හැකි ආකාරය




(1)



(2)



(3)



(4)

14. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගය වන්නේ
(1) ඩෙංගු උණ ය. (2) මැලේරියාව ය. (3) බරවා ය. (4) කොළරාව ය.


15. කමත් බසින් "බැත" යැයි හඳුන්වනු ලබන්නේ මොනවා ද?
(1) බත් (2) වී (3) ගොයම් (4) පිදුරු

16. සතුරකු වල්ගයෙන් ඇල්ලූ විට, වල්ගය කඩා පලායන සතකු වන්නේ
(1) තලගොයා ය. (2) කබරගොයා ය. (3) හූනා ය. (4) කටුස්සා ය.

17. කිරි පැකැට්ටුවක් බීම සඳහා විවෘත කිරීමට පෙර පැකැට්ටුවේ සඳහන් කරුණු අතුරෙන් වඩාත් ම සැලකිලිමත් විය යුත්තේ
(1) කල් ඉකුත් වන දිනය කෙරෙහි ය.  (2) නිෂ්පාදනය කළ දිනය කෙරෙහි ය.
(3) අඩංගු කිරි පරිමාව කෙරෙහි ය.  (4) කිරිවල අඩංගුකර ඇති දේ කෙරෙහි ය.


18. පහත සඳහන් ඒවා අතුරෙන් ජාතික සංකේතයක් නොවන්නේ කුමක් ද?
(1) නිල් මානෙල් (2) පුන් කලස (3) නා ගස (4) වලි කුකුළා

19. ගල පහසුවෙන් පෙරළීමට දණ්ඩ අල්ලාගතයුතු වඩාත් ම සුදුසු ස්ථානය දැක්වෙන රූපය කුමක් ද?


(1)


(2)


(3)


(4)

[ පස්වැනි පිටුව බලන්න


20. කහපාට පසුතලයක දැක්වෙන මෙම මාර්ග සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?




(1) ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි
(2) පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි
(3) ඉක්මනින් ම පාර පනින්න
(4) පදිකයන් මාරුවන ස්ථානය

21. බයිසිකලයක පිටුපස මඩ ආවරණයේ පහළ කොටසේ රතු පැහැති පරාවර්තකයක් (ටේල් ලයිට් එකක්) තිබීම අත්‍යවශ්‍ය වන්නේ
(1) රාත්‍රී කාලයේ පයින් ගමන් කරන අයගේ ආරක්ෂාව සඳහා ය.
(2) රාත්‍රී කාලයේ පාර හරහා පනින අයගේ ආරක්ෂාව සඳහා ය.
(3) රාත්‍රී කාලයේ දී පසු කරනු ලබන පයින් ඇවිදින්නන්ට පෙනීම සඳහා ය.
(4) රාත්‍රී කාලයේ පිටුපසින් එන වාහනවලට පෙනීම සඳහා ය.


22. නූලකින් එල්ලා ඇති කාන්දම් කැබැල්ලක් 1 රූපයෙන් දැක්වේ. කඩදාසියක ඔතන ලද යමක් කාන්දම් කැබැල්ල අසලට ගෙන ආ විට කාන්දම් කැබැල්ල පිහිටන ආකාරය 2 රූපයෙන් දැක්වේ.
කඩදාසියේ ඔතා ඇත්තේ
(1) ඇලුමිනියම් කැබැල්ලකි. (2) යකඩ කැබැල්ලකි.
(3) කාන්දම් කැබැල්ලකි. (4) පිත්තල කැබැල්ලකි.



1 රූපය


2 රූපය

23. විදුලි කෝෂ (C) දෙකක්, බල්බයක් (B) සහ ස්විච්චයක් (S) වයර් කැබැලි මගින් පහත සඳහන් එක් එක් ආකාරයට සම්බන්ධකර ඇත. S ස්විච්චය දැමූ විට බල්බය දැල්වෙන රූපය කුමක් ද?




(1) (2) (3) (4)

24. වොලිබෝල් (අත්පන්දු) ක්‍රීඩාව සඳහා එක් පිලකට අයත් ක්‍රීඩකයින් සංඛ්‍යාව කොපමණ ද?
(1) 6 (2) 7 (3) 10 (4) 12

25. මැණික් ගඟ අසබඩ පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(1) හලාවත (2) කතරගම (3) කළුතර (4) ත්‍රිකුණාමලය

26. ශ්‍රී ලංකාව ඉංග්‍රීසි පාලනයෙන් මිදී නිදහස ලැබූ වර්ෂය කුමක් ද?
(1) 1945 (2) 1948 (3) 1972 (4) 1978

27. බොත්තම් කාසයක් මැසීමේ දී යොදා ගන්නා මැහුම් ක්‍රමය ඇතුළත් රූපය කුමක් ද?


(1) (2) (3) (4)


[ හයවැනි පිටුව බලන්න.

28. "ඒත් ඇදිච්ච ද බලකොයි නැතෝ
ගසට පලච්ච ද බලකොයි නැතෝ"
ඉහත කවිය ගායනා කරනු ලබන්නේ කිනම් ජන ක්‍රීඩාවේ දී ද?
(1) එළවන් කැම (2) ගොයම් කැපීම (3) ඔළිඳ කෙළිය (4) කළගෙඩි සෙල්ලම

- පහත කොටුවේ ශාක කිහිපයක නම් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ඉරමුසු | මුරුංගා | මොණරකුඩුම්බිය | එරබදු |
| පොල්පලා | කොහොඹ | කෝමාරිකා | ඉරිවේරිය |

ඒවායින් එක් එක් රූපයට ගැළපෙන නම තෝරා තිත් ඉර මත ලියන්න.










29. ........................ 30. ........................ 31. ........................ 32. ........................

- පහත කොටුවේ පක්ෂීන් කිහිපදෙනකුගේ නම් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| උකුස්සා | කොකා | කැරලා | කුකුළා |
| කොට්ටෝරුවා | තාරාවා | පිළිහුඩුවා | කැදැත්තා |

එක් එක් රූපයේ දැක්වෙන පාද අයත් පක්ෂියාගේ නම තෝරා තිත් ඉර මත ලියන්න.

33. .................. 34. .................. 35. .................. 36. ..................

37. ළමයකුට දිනපතා උදේට සහ සවසට විස්කෝතු 3 බැගින් කෑමට දෙනු ලැබේ. විස්කෝතු 72 ක පැකැට්ටුවක් මේ සඳහා දින කීයකට සෑහේ ද? ..................

38. දුම්රිය ස්ථානයකට පස්වරු 12.50 ට පැමිණීමට නියමිත දුම්රිය මිනිත්තු 15 ක් පමාවන බව දැනුම් දෙන ලදී. ඒ අනුව, දුම්රිය පැමිණෙනු ඇත්තේ කීයට ද? ..................

39. කෙසෙල් ගෙඩි 1 kg ක් රුපියල් 40.00 ක් වේ. 1 kg 250 g බර කෙසෙල් ගෙඩි ඇවරියක් සඳහා ගෙවිය යුතු මුදල කීය ද? ..................

40. අභ්‍යාස පොත් 321 ක් පන්ති තුනක් අතර සමව බෙදන ලදී. එක් පන්තියකට ලැබුණ පොත් සංඛ්‍යාව කීය ද? ..................

[ අනෙක් පිටුව බලන්න

**41.** එක්තරා විද්‍යාලයක සිසුන්ගෙන් ඔවුන් වඩාත් ම කැමති ක්‍රීඩා පිළිබඳ විමසීමක් කරන ලදී. එමගින් හෙළි වූ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| ක්‍රීඩාව | සිසු සංඛ්‍යාව | |
|---|---|---|
| | පිරිමි | ගැහැනු |
| ක්‍රිකට් | 75 | 57 |
| බැඩ්මින්ටන් | 85 | 104 |
| නෙට්බෝල් | 0 | 139 |
| වොලිබෝල් | 90 | 0 |


(i) ක්‍රිකට් ක්‍රීඩාවට කැමති මුළු සිසු සංඛ්‍යාව කීය ද? ....................

(ii) වගුවේ සඳහන් මුළු ගැහැනු සිසු සංඛ්‍යාව කීය ද? ....................


(iii) බැඩ්මින්ටන් ක්‍රීඩාවට කැමති ගැහැනු සිසු සංඛ්‍යාව සහ පිරිමි සිසු සංඛ්‍යාව අතර වෙනස කීය ද? ....................

(iv) මෙහි සිසුන් අතර වඩාත් ම ජනප්‍රිය ක්‍රීඩාව කුමක් ද? ....................

(v) එක් එක් ක්‍රීඩාවට කැමති පිරිමි සිසු සංඛ්‍යා දැක්වෙන ස්තම්භ ප්‍රස්තාරයක් අඳින්න. ස්තම්භ අඳුරු කරන්න.




**42.** කතිර ගොඩවල් තුනක්, රටාවකට අනුව පහත කොටු තුළ ඇඳ ඇත. එම රටාවට අනුව ඊළඟ කොටුවේ කතිර අඳින්න.



**43.** එකතු කරන්න : $\frac{1}{4} + \frac{3}{8}$ ....................

**44.** භාජනයක් පිරවීමට ජලය $5\,l$ $540\,ml$ පරිමාවක් අවශ්‍ය ය. එවැනි භාජන 4 ක් පිරවීමට අවශ්‍ය ජලය පරිමාව කොපමණ ද? ....................


[ අටවැනි පිටුව බලන්න.

**45.** රූපයේ පෙන්වා ඇති සෙන්ටිමීටර පරිමාණයට අනුව මාලාට වැඩියෙන් රාජා කොපමණ උස ද?





..................

**46.** පරතරය 1 cm වන පරිදි ඇණ ගසා ඇති **තාදැති පුවරුවක්** රූපයේ පෙන්වා ඇත. සිහින් රබර් පටියක් ඇණ වටා යැවීමෙන් නිර්මාණය කර ඇති හැඩයේ වර්ගඵලය කොපමණ ද?



..................

**47.** ඝනකාභ හැඩයෙන් යුත් එක සමාන ලී කුට්ටි පහක් පෙන්වා ඇති පරිදි එක මත එක තැබීමෙන් නිර්මාණය කළ හැඩයක් රූපයේ දක්වේ. එහි පතුලේ දිග 3 cm කි. එහි උස කොපමණ දැයි හිස්තැනෙහි ලියන්න.




**48.** **පහත දැක්වෙන කොටස කියවන්න.**

පාසලේ උදය රැස්වීම ආරම්භයේ දී විදුහල්පතිතුමා මෙසේ ප්‍රකාශ කළේ ය.

"අද අපට හරිම සතුටු දවසක්. අප විද්‍යාලයේ ශිෂ්‍යයකු විද්‍යාලයට **කීර්තියක්** ලබා දෙමින් ජාත්‍යන්තර චිත්‍ර තරගයකින් පළමුවැනි ස්ථානය ලබා තිබෙනවා. ඔහුට හිමි ත්‍යාගය ලබා ගැනීම සඳහා ජපානයට පැමිණෙන ලෙස ආරාධනයක් ද ලැබී තිබෙනවා". විදුහල්පතිතුමා මෙසේ පවසද්දී දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. නැවතත් කථාව ආරම්භ කළ විදුහල්පතිතුමා මෙසේ පැවසීය.

"ඒ වාසනාවන්ත දරුවා තමයි පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන තරිඳු දේශප්‍රිය. විදුහල වෙනුවෙන් මා ඔහුට සුබ පතනවා. මා දන් ඒ කීර්තිමත් ශිෂ්‍යයාට ඉදිරියට පැමිණෙන ලෙස ආරාධනා කරනවා". නිශ්ශබ්දතාව බිඳිමින් සියලු දෙනා ම අත්පොළසන් දෙන්නට වූහ.

**තරිඳු ඔබ නම්, මෙම අවස්ථාවේ දී ඔබට ඇතිවන හැඟීම් දැක්වෙන නිර්මාණාත්මක වාක්‍ය හයක් ලියන්න.**

(එක් එක් වාක්‍යයක වචන **හතරක්වත්** ඇතුළත් විය යුතු ය. එම වාක්‍යවල **උක්ත**, **ආඛ්‍යාත** සම්බන්ධය නිවැරදි විය යුතු ය.)

(i) ..................................................................................................

(ii) ..................................................................................................

(iii) ..................................................................................................

(iv) ..................................................................................................

(v) ..................................................................................................

(vi) ..................................................................................................

***